#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #SundayMawbima

වෛද්‍ය සාෆිට එරෙහිව නැඟී ඇති චෝදනාවන් සහ ඒ සම්බන්ධයෙන් වන විවිධ මති මතාන්තරයන් මෙම දිනවල පුවත්පත් තුළ බොහෝ සෙයින් ආවරණය කෙරෙනු දක්නට ලැබේ. කෙසේ නමුත් මෙම පුවත් වාර්තාවන් හා ලිපි නිරීක්ෂණය කළ විට යම් යම් ගැටළුකාරී තැන්ද දැකීමට හැකි විණි. උදාහරණ ලෙසින් පහත පෝස්ටුවේ දැක්වෙන ලිපි කිහිපය ගත හැක. "දොස්තර සාෆිගේ වටලප්පන් රහස" මැයෙන් යුතුව, කිසිදු තහවුරු කරගැනීමක් නොමැති කරුණු කිහිපයක් එක්තැන් කොට 'ගවේෂණාත්මක ලිපියක්' ලෙසින් දැක්වූ ලිපියක අදාළ සැකකාර වෛද්‍යවරයා අපරාධකරුවෙකු ලෙසින් හුවාදැක්විමේ තැතක් දක්නට ලැබිණි. තවත් ලිපියක දැක්වෙන "මුස්ලිම් වෛද්‍යවරුන්ගේ ප්‍රියතම ස්ථානය නාරිවේද වාට්ටුවය" වැනි ප්‍රකාශයන් සිදුකොට ඇත්තේ කුමනාකාරයක සමීක්ෂණයක ප්‍රතිඵලයක් ඔස්සේද යන්න පාඨකයින් විසින් අප ඇසිය යුතු කාරණයකි. එසේම මෙම ලිපි සඳහා යොදාගෙන ඇති සිරස්තලයන්හි අවුළුවන සුළු ස්වභාවයන් සහ උත්ප්‍රාසයන් ගැබ්ව නොතිබෙන්නේද යන්න පාඨකයා විසින් තීරණය කළ යුතුවේ. මෙම පුවත් හා ලිපි ඔස්සේ නීතිය ඉදිරියේ තවමත් සැකකරුවෙකු වන පුද්ගලයෙකු, ඒ සම්බන්ධ විමර්ශණයන් අවසන් වීමටද පෙරාතුව වරදකරුවෙකු ලෙසින් තහවුරු කිරීමට උත්සාහ ගැනීමක් සිදුවන්නේද යන්න පාඨක අප ඇසිය යුතු පැනයකි. එසේම සිදුවෙමින් පවත්නා පරීක්ෂණයක සැකකරුවෙකු අපරාධකරුවෙකු ලෙසින් වර්ණ ගන්වා සමාජගත කිරීම කෙතරම් මාධ්‍ය සදාචාරයට එකඟ වන්නේද යන්නද පාඨක අප ප්‍රශ්න කළ යුතු කරුණකි.